මෙම වාර්තාව ඉංග්‍රීසි බසින් සිංහල බසට පරිවර්තනය කර ඇත්තේ වැඩි පාඨක පිරිසකගේ ප්‍රයෝජනය සඳහාය. නමුත්, ආසියානු සංවර්ධන බැංකුවෙහි නිළ භාෂාව වූ ඉංග්‍රීසි බසින් නිකුත් වූ පිටපත මෙහි නිළ හා පිළිගත් වාර්තාව වන්නේය. යම්කිසි උපුටා ගැනීමකදී මෙහි ඉංග්‍රීසි පිටපත සඳහන් විය යුතුය. ආසියානු සංවර්ධන බැංකුව පරිවර්තනයෙහි වලංගු බවට හෝ විෂමතා වලට වගකියනු නොලැබේ.

# විධායක සාරාංශය

01. ශ්‍රී ලංකාවේ තැගෙන ප්‍රථම පිවිසුම් පාලන අධිවේගී මාර්ගය, දක්ෂිණ ලංකා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය වේ. බස්නාහිර පළාතේ කොට්ටාව නගරයේ සිට දකුණු පළාතේ මාතර නගරය දක්වා එය කිලෝ මීටර් 128 ක දුරක් ගෙවයි. එය පියවර කිහිපයකින් තැනෙයි.

මුලින්ම මංතීරු හතරක මාර්ගයක් ලෙස සකසා පසුව මධ්‍යම තීරුවට ආසන්නව මාර්ග පථයේ දෙපසින් අතිරේක මංතීරුව බැගින් තැනීමට යෝජිතය. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ආර්ථික වශයෙන් දුර්වල දකුණු පළාතේ සංවර්ධනය සඳහා කර්මාන්ත, සංචාරක, ධීවර හා කෘෂිකාර්මික යන අංශයන්හි වර්ධනය නංවාලීමට පෙළඹවීමය. මෙයින් රැකියා අවස්ථාවන් ඇති වී දරිද්‍රතාවය අඩු වේ යයි අපේක්ෂා කෙරේ.

02. මාර්ග පථය දෙපස ජීවත්වන ජනතාවට වන හානිය අවම වනසේ පහත කරුණු සැලකිල්ලට ගෙන එය සැලසුම් කර ඇත.

i. ගෙවතු සහ කුඹුරු ඉඩම් මග හැරීමට කඳු බෑවුම් හසුවන සේ මාර්ග පථය සැකසීම,

ii. හැකි සෑම අවස්ථාවක දී ම මීටර් 80 සිට 60 දක්වා මාර්ග පථයේ පළල අඩු කිරීම,

iii. මාර්ග මුහුණත කැපෙන පස් වලින් පුරවණ ලද බෑවුම් සමග කලනය වන සේ සැකසීම.

iv. පරිහරනයෙන් තොර රජයේ ඉඩම් පස් ගැනීමට යෝජිත ස්ථාන වශයෙන් ලකුණු කිරීම,

v. මෙයට අමතරව, හානි අවම කිරීම සඳහා,

මාර්ග සහ වාහන මාරු ස්ථාන 186 ක් දැනට ඇති ගමනාගමන පද්ධතිය සහ මාර්ග පථයන් සමග සම්බන්ධ කිරීමට සැලසුම් කර ඇත.

03. මෙවැනි උත්සාහයන් මධ්‍යයේ වුවද, මාර්ග සංවර්ධන අධිකාරියට, දක්ෂිණ ලංකා අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ඉඩම් හෙක්ටයාර් 951.17 ( කට්ටි 8745 ) අත්පත් කර ගැනීමට සිදු වේ. දැනට ඇති ඇස්තමේන්තුව අනුව, සියළුම වර්ගයන්ට අයත් ඉඩම් හිමියන් 5683 දෙනෙකු දේපළ අහිමිවීමට ලක්වේ. මෙයට අමතරව නිර්මිත 1488, ගෙවතු 1315 සහ වාණිජ ස්ථාන 151 ක් හානියට ලක්වේ. මේ අය අතුරින් ගෘහස්ථ 214ක් දුබල ගණයට ගැනේ. මොවුන් සඳහා ආදායම් නගාලීමේ විශේෂ උපාය මාර්ග සකසා ඇත.

04. වර්ෂ 1999 මාර්තු මස ව්‍යාපෘති ප්‍රදේශය තුළ පළමු සමාජ ආර්ථික සමීක්ෂණය කළේ ය. මෙයින් පසු 1999 ජූලි මස ප්‍රතිස්ථාපන සැලසුමක් සැකසුනි. මාර්ග පථයේ සැලසුමේ ආසියානු සංවර්ධන බැංකුවෙන් ආධාර ලබා තැනෙන කොටසේ 75% ක පමණ සංශෝධනයක් ඇති වූ බැවින්, වර්ෂ 2000 මැයි, අගෝස්තු කාලය තුළ නැවත සාමාජීය ආර්ථික සමීක්ෂණයක් කළේ ය. අහිමිවන දේපළ වෙනුවෙන් විස්තරාත්මක වට්ටෝරුවක් සැකසීම 2000යේ අගෝස්තු මස ආරම්භ කර ඇති අතර, එම කර්තව්‍ය 2002 සැප්තැම්බර් මස අවසාන වීමට යෝජිත ය.

05. ජාතික සාමාන්‍ය ජනගහන ඝණත්වයට( වර්ග කි. මී. / 351 ) වඩා අධික ප්‍රදේශ හරහා මාර්ග පථය දික්වේ. මාර්ග ප්‍රදේශයේ ( Traverse ) ජනගහන ඝණත්වය ( වර්ග කි. මී. 1 / 940කි. ) ජනගහනයෙන් තුනෙන් එකක් පමණ නාගරික වේ. ඉඩම් පරිහරණයේ ස්වාභාවය වැඩි වශයෙන් ග්‍රාමීය හා අර්ධ ග්‍රාමීය, ජනාවාස වන අතර, ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම කෘෂිකර්මය වන්නේ ය.

25% ක් ගෘහස්ථයන් හී ඇස්තමේන්තු මාසික ආදායම රුපියල් 3000.00කට අඩු වන අතර, 37% ක් රුපියල් 3000.00 - 5000.00 අතර ආදායමක් ලබයි. 38% ක් පමණ මාසකට රුපියල් 5000.00කට අධික ආදායමකට හිමිකම් කියයි. දල වශයෙන් මෙම පවුල් අතරින් (H/H) 21%ක් පමණ දරිද්‍රතාවයේ තිල මට්ටමට පහළින් සිටී.

06. ප්‍රතිපාදන වැඩ සටහන හා වන්දි ගෙවීම් සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම සඳහා ව්‍යාපාති ප්‍රදේශය තුල ප්‍රචාරක වැඩ සටහනක් 1999 ඔක්තෝම්බර් මස දියත් කරන ලදී. ව්‍යාපෘතිය හා සඳහන් විස්තර හා වන්දි ගෙවීම් අඩංගු අත්පත්‍රිකා බෙදා දෙන ලදී. මෙ රැස්වීම් සඳහා ප්‍රාදේශිය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන්, පලාත් සභා මන්ත්‍රීවරුන්, ප්‍රජා නායකයින් සහ විහාරාධිපතිවරුන් සහභාගී විය. සාමාජිය හා ආර්ථික සමීක්ෂණවල දී ව්‍යාපෘතිය සම්බන්ධ තොරතුරු, එමගින් ඇතිවිය හැකි බලපෑම් සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය මහජනතාවට දන්වන ලදී.

අපදාවන්ට ලක් වූ පවුල් සමඟ වඩාත් පුළුල් සංවාද 2000 නොවැම්බර් මස පටන්ගෙන 2002 සැප්තැම්බර් මස අවසන් කරන ලදී. ව්‍යාපෘතියේ නිර්මිතයන් සහ කාලවකවානු මොවුන්ට සැපයූ අතර, වන්දි සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කරන ලදී.

07. 1999 ජූලි මස සකස් කරන ලද මූලික ප්‍රතිස්ථාපන සැලැස්මේ, දක්ෂිණ ලංකා අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්ති දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති වලට අනුකූල වන අතර, මෙම ප්‍රතිස්ථාපන ක්‍රියාත්මක කිරීමේ සැලැසුම, ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ගයන්, වගකීම්, හිමිකම්, මූල්‍ය හා ක්‍රියාත්මක කිරීමේ කාලසටහන ඉතා සවිස්තරව පෙන්වා ඇත.

දක්ෂිණ ලංකා අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ වන්දි, ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනතේ සාමාන්‍ය වන්දි ක්‍රමය ඉක්මවා යයි. විශේෂයෙන්ම දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයේ ප්‍රතිස්ථාපන ප්‍රතිපත්ති අනුව, නැවත මිල දී ගැනීමේ වන්දි ක්‍රමය හා ආපදාවන්ට ලක්වූවන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීම, නැවත පිහිටුවීමේ අවශ්‍යතාවය හඳුනා ගනී. ඉඩම් සඳහා අයිතිවාසිකමක් නැති අය සඳහා ද, ප්‍රමාණවත් වන්දි මුදලක් ලබාදීමට ඉඩ සලසා ඇත. දුබල යැයි හඳුනාගෙන ඇති ආපදාවන්ට ලක් වූ අය සඳහා අදායම් පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහන් දියත් කෙරේ.

නැවත පදිංචිවීමට කැමැත්ත දක්වා ඇති ආපදාවන්ට ලක්වූවන් සඳහා මූලික යටිතල පහසුකම් සහිත ප්‍රතිස්ථාපන වැඩ බිම් සපයනු ඇත. සියකැමැත්තෙන් තොරව නැවත පදිංචි වන අය සඳහා 2001 මැයි මස රජය අනුමත කර ඇති ජාතික ප්‍රතිපත්තියෙන්ද ව්‍යාපෘතියට වාසිදායක විය.

08. ඉඩම් අත්පත් කර ගැනීම 2000 ජූලි මස ආරම්භ කල අතර, ප්‍රතිස්ථාපන ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2002 ඔක්තෝම්බර් මස සිට 2005 දෙසැම්බර් මස තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවෙන් ආධාර ලබන කොටසේ පළමු පියවරේ ප්‍රතිස්ථාපන කටයුතු 2002 දෙසැම්බර් මස 30 වන දාට පෙර අවසන් කිරීමට නියමිත ය.

09. 10% අතිරේක වියදම් සහිත ඇස්තමේන්තුගත ප්‍රතිස්ථාපන පිරිවැය රුපියල් 2,861,503,350.00 ක් වේ. මෙය අමෙරිකානු ඩොලර් මිලියන 29.75කි. ප්‍රතිස්ථාපන ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යාවත්කාලීන කිරීමේ දී හඳුනා ගැනෙන ආපදාවන්ට ලක්වන අතිරේක පවුල් සඳහා ගෙවිය යුතු වන්දි මුදල එම අවස්ථාවන්හි දී යාවත්කාලීන කෙරෙන හානිවන බඩු වට්ටෝරු හා පරිපාලන ගාස්තු සඳහාද මෙම පිරිවැය ප්‍රමාණවත් වේ.

10. ප්‍රතිස්ථාපන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් එහි ප්‍රතිස්ථාපන අංශයට වේ. ප්‍රතිස්ථාපන නිලධාරීයෙකුගේ සහ උපාධිධාරී සමාජ විද්‍යාඥයින් 7 - 8 දෙනෙකුගේ සහ කාර්යාල සහායක පිරිසකගෙන් සමන්විත ප්‍රතිස්ථාපන ඒකක හතරක් මගින් මේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. සමාජ උපදේශක කණ්ඩායම් අවතැන්වූවන්ට තමන්ගේ අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට සහාය වන අතර, ඔවුන්ගේ වෙනත් දුක්කම්කටොලු පිළිබඳ කටයුතු කරනු ඇත. ආදායම් පුනරුත්ථාපන ක්‍රියා පිළිවෙලටද එම කමිටු සහාය වනු ඇත.

ඉඩම් අත්පත් කර ගැනීම්, වන්දි ගෙවීම් සහ ප්‍රතිස්ථාපන ගැටළු ආදිය පරිපාලන ක්‍රමවේදයකින් තොරව ගම් මට්ටමේදීම විසඳා ගැනීම සඳහා නීතියෙන් පරිබාහිර ඇස්වැසුම් කමිටු මගින් සිදු කෙරේ.

11. දක්ෂිණ ලංකා අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ, ප්‍රතිස්ථාපන කටයුතු ප්‍රමාණවත් ලෙස, නිරීක්ෂණය කිරීම සහ ඇගයීම් සක්ෂාත් කිරීමේ වගකීම මාර්ග සංවර්ධන අධිකාරියට පැවරී ඇත.

ව්‍යාපෘතිය මගින් ලබාදෙන හිමිකම් බෙදා දීම, පරිහරණය සහ එහි බලපෑම් අභ්‍යන්තර නිරීක්ෂනය මගින් විපරණය කෙරේ.

අවතැන්වන අයගේ මූලික තොරතුරු පරිසණක දත්ත ගත කර, පැහැදිලිව විග්‍රහ කරන ලද, මිනුම් ආශ්‍රයෙන් මෙම දත්තයන් මූලික සටහනක් සේ උපයෝගී කර ගනිමින්, ඔවුන්ගේ ප්‍රගතිය මනිනු ඇත.

කිරීක්ෂණ කටයුතුවල දී අවතැනට ලක් වූ අය, සක්‍රිය ලෙස යොදා ගනු ඇත. ප්‍රතිස්ථාපන ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇගයීම්, ජාත්‍යන්තර ප්‍රතිස්ථාපන විශේෂඥයෙකු මගින් ඉටු කරනු ඇත. කලින් කලට ලැබෙන නිරීක්ෂණ හා ඇගයීම් වාර්තා පදනම් කර ගෙන, ප්‍රතිස්ථාපන වැඩ සටහනට අවශ්‍ය සංශෝධන මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ඇත.

12. දක්ෂිණ ලංකා අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ, ප්‍රතිස්ථාපන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමට, මෙම වාර්තාව පාදක වේ.